**ශීර්ෂය 295- වාණිජ දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

---

ශීර්ෂය 295 - වාණිජ දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 දෙසැම්බර් 16 දින දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

---

**2.1 විසර්ජන ගිණුම්**

---

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

---

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 121.90 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 108.14 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. මිලියන 13.76 ක් හෙවත් සියයට 11.29 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 105.65 | 96.00 | 9.65 | 9.13 |
| මූලධන | 16.25 | 12.14 | 4.11 | 25.29 |
| **එකතුව** | **121.90** | **108.14** | **13.76** | **11.29** |

**2.2 අත්තිකාරම් ගිණුම**

**2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබූණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාළ විෂයය අංක 29501 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| **වියදම** | | **ලැබීම්** | | **හර ශේෂය** | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** |
| 5.88 | 2.23 | 2.38 | 3.61 | 20.00 | 11.98 |

**2.3 විගණන නිරීක්ෂණය**

වාණිජ දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරික්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**3.1 විසර්ජන ගිණුම**

**අයවැය විචලනය**

වැය විෂයයන් 16 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 8 ක සිට සියයට 97ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**3.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විෂය අංක 29501 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරික්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව විදේශ දූත මණ්ඩලවල සේවයේ යෙදී සිටින නිලධාරීන්ගෙන් 2015 දෙසැම්බර් 31 දිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.183,622 ක් වී තිබුණි. එම ශේෂ වර්ෂ 04 ක සිට පැවත එන නමුත් එම ණය ශේෂ අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

(ආ) සැසඳුම් ප්‍රකාශය අනුව 2011 වර්ෂයේ සිට හිඟහිටව තිබුණු හා 2013 වර්ෂයේදී විශ්‍රාම ගිය වාණිජ අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන් රු.26,894 ක් අයවිය යුතුව තිබුණත්, එම ණය ශේෂය 2016 ඔක්තෝබර් 31 දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2015 වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබුණු කේවල ශේෂ වර්ගීකරණ සාරාංශය අනුව හඳුනා නොගත් ණය ශේෂය රු.121,426 ක් වූ අතර එම ශේෂ හඳුනාගෙන පොත්වලට ගැලපීමට කටයුතු කර නොතිබුණි.

**3.3 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

**3.3.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**3.3.2 ප්‍රසම්පාදන සැලැස්ම**

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (අ), (ආ) හා (ඉ) ප්‍රකාරව, ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් අවම වශයෙන් වර්ෂ 03 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ඇතුළත් කර ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර එළඹෙන වර්ෂය සඳහා වූ ප්‍රසම්පාදන කටයුතු විස්තරාත්මකව පිළියෙල කළ යුතු බව සඳහන් කර තිබුණත්, දෙපාර්තමේන්තුව විසින් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

**3.3.3 අභ්‍යන්තර විගණනය**

දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි. එම කටයුතු කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකය විසින් කළ යුතුව තිබුණත්, එම ඒකකය විසින් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

**3.4 කාර්යසාධනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකාවේ සමස්ත ආනයනය, සමස්ත අපනයනය, සමස්ත වෙළඳාම සහ වෙළඳ ශේෂය පිළිබඳ තොරතුරු ඉකුත් වර්ෂය හා සසඳා පහත දැක්වේ.

| කාර්යය | 2015 වර්ෂයේ වටිනාකම | 2014 වර්ෂයේ වටිනාකම | ඉකුත් වර්ෂයට සාපේක්ෂව අඩුවීම | අඩුවීමේ ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | ඇ.ඩො.මිලියන | ඇ.ඩො.මිලියන | ඇ.ඩො.මිලියන | |
| අපනයන | 10,212 | 11,044 | 832 | 7.53 |
| ආනයන | 18,989 | 19,246 | 257 | 1.34 |
| සමස්ථ වෙළඳාම | 29,201 | 30,290 | 1,089 | 3.60 |
| වෙළෙඳ ශේෂය සෘණ | 8,777 | 8,202 | 575 | 7.01 |

(ආ) විදේශ වාණිජ නියෝජනය පිළිබඳව වාණිජ නිලධාරීන් විසින් සිදුකරන ලද ක්‍රියාකාරකම්වල සාරාංශයක් පහත දැක්වේ.

| ක්‍රියාකාරකම් | 2015 වර්ෂය | 2014 වර්ෂය | ඉකුත් වර්ෂයට සාපේක්ෂව | |
|---|---|---|---|---|
| | | | සමාලෝචිත වර්ෂයේ වැඩිවීම / (අඩුවීම) | වැඩිවීමේ හා (අඩුවීමේ) ප්‍රතිශතය |
| | සංඛ්‍යාව | සංඛ්‍යාව | සංඛ්‍යාව | |
| ප්‍රවර්ධන සල්පිල් සඳහා සත්කාරක රට වෙත ශ්‍රී ලංකාවේ සහභාගීත්වය | 1,202 | 798 | 404 | 50.62 |
| ප්‍රවර්ධන සල්පිල් සඳහා ශ්‍රී ලංකාව වෙත සත්කාරක රටෙහි සහභාගීත්වය | 247 | 191 | 56 | 29.31 |
| සත්කාරක රටවලදී ශ්‍රී ලංකා විශේෂී (තනි- රට) ප්‍රචාරණ වැඩසටහන් පැවැත්වීම. | 63 | 33 | 30 | 90.90 |
| ශ්‍රී ලංකාව වෙත දූත පිරිස් පැමිණීම | 575 | 422 | 153 | 36.25 |
| සත්කාරක රට වෙත සංචාරය කළ දූත පිරිස් | 888 | 883 | 5 | 0.56 |
| සත්කාරක රට වෙත පුද්ගල සංචාරයන් | 141 | 280 | (139) | (49.64) |
| ශ්‍රී ලංකාව වෙත පුද්ගල සංචාරයන් | 153 | 237 | (84) | (35.44) |

ඉහත දත්ත අනුව විදේශ වාණිජ නියෝජනය යටතේ සත්කාරක රට වෙත හා ශ්‍රී ලංකාව වෙත පුද්ගල සංචාරයන් පෙර වර්ෂයට වඩා පිළිවෙලින් 139 ක් හා 84 ක් හෙවත් සියයට 50

ක් හා සියයට 35 ක ප්‍රමාණයකින් අඩු වී තිබුණි. එසේ හෙයින් ශ්‍රී ලංකාව තුළ දේශීය හා විදේශීය ආයෝජන ප්‍රවර්ධනය කරගැනීම සඳහා වාණිජ නිලධාරින්ගේ ඍජු මැදිහත්වීම මත සංචාරක අවස්ථා හඳුන්වාදීමේ අවශ්‍යතාවය විගණනයේදී නිරීක්ෂණය විය.

**(ඈ)** දෙපාර්තමේන්තුව විසින් වරණීය වෙළඳ ගිවිසුම් සහ කලාපීය, ද්වීපාර්ශ්වික හා නිදහස් වෙළඳ ගිවිසුම් යටතේ අපනයනය කරනු ලබන ශ්‍රී ලාංකීය සම්භවීය (origin) නිෂ්පාදන සඳහා ප්‍රභවස්ථාන සහතික නිකුත් කර තිබුණි. 2014 වර්ෂයේදී එම සහතික 120,302 ක් නිකුත් කර තිබුණි. සමාලෝචිත වර්ෂයේදි 108,664 ක් සහතික නිකුත් කර තිබුණි. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී සහතික 11,658 ක් හෙවත් සියයට 10 කින් අඩු වි තිබුණි.

(ඇ) දෙපාර්තමේන්තුව විසින් 2015 වර්ෂය සඳහා ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කර තිබුණද, එම ක්‍රියාකාරි සැලැස්මේ සඳහන් එක් එක් කාර්යයන් ඉටුකිරිමේ ප්‍රගතිය දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කර තිබුණු කාර්යසාධන වාර්තාවේ සඳහන් කර නොතිබුණි.

(ඉ) විදේශ වාණිජ නියෝජනය යටතේ වෙළඳාම, ආයෝජනය සහ සංචාරක ව්‍යාපාරයේ ප්‍රවර්ධන සඳහා අවධානය යොමු කරමින් විදේශ රටවල ස්ථාපිත ශ්‍රී ලංකා දූත මණ්ඩල 25 ක දෙපාර්තමේන්තුවේ නිලධාරින් 27 දෙනෙකුගෙන් සමන්විත වාණිජ නියෝජනයක් සිදුකර තිබුණි. එම එක් එක් දූත මණ්ඩලවල වාණිජ නිලධාරින් විසින් ඉටුකරන ලද වාණිජ කාර්යයන් පිළිබඳ ප්‍රගතිය ඇගයීමට හැකිවන පරිදි කාර්යසාධන වාර්තා පිළියෙල කර නොතිබුණි.

**3.5 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 65 | 51 | 14 |
| (ii) | තෘතියික මට්ටම | 02 | 02 | 0 |
| (iii) | ද්විතියික මට්ටම | 62 | 44 | 18 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 19 | 17 | 2 |
| | එකතුව | 148 | 114 | 34 |